


'මතකය' නමැති ඒ කුඩා පැදි පෙළෙන් ධ්වනිත වන්නේ ඇබරිජින ජාතිකයන් තුළ පවත්නා දැඩි ආත්මාභිමානයයි. ස්වකීය පරම්පරා උරුමයන් වූ මහ පොළොව, ගංගා ඇළ දොළ වනාන්තර වලට සුදු ජාතිකයන් කළ විපතට වඩා ඔවුන් දැඩි කම්පනයට පත් වන්නේ තම ජාතියේ හදවත ඔවුන් කළ නිගාවයි. සුදු ජාතිකයන් කළ කවර වරදකට සමාව ලැබුනත් ආදිවාසී හදවතම, ආත්මයට සිදුකළ හානියට කිසිවිටක සමාවක් නොලැබෙන බව කියවෙන්නේ ඒ නිසාය.




පසුගිය පෙබරවාරි මාසයේදී තුනිබණා නුවර පාර්ලිමේන්තු මන්දිරයේදී මස්වුලියන අගමැතිවරයා ආදිවාසී ජනතාවගෙන් සමාව අයදමින් ඉදිරිපත් කළ දේශනය, ඕස්ට්‍රේලියාවේ වත්මන් ඉතිහාසයේ එක්තරා සන්ධිස්ථානයක් ලෙස සැලකිය යුතුය. ශතවර්ෂයක් පමණ කාලයක් තිස්සේ ඕස්ට්‍රේලියානු රජය ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තියක් අනුව, මෙරට ආදිවාසී ජනකාය වන ඇබරිජින ජාතිකයන්ගේ දරුවන් ඔවුන්ගෙ " දෙමාපියන්ගේ අවසරය නැතුව ඔවුන්ගෙ " පවුල්වලින් ඉවත් කර සුදු ජාතික පවුල්වල හා ආගමික දේවස්ථාන ඇතුළු රජයේ ආයතනවලට බාර දෙන ලදී. රජය ප්‍රකාශ කළේ මේ ක්‍රියාමාර්ගයේ අරමුණ කලු ජාතික දරුවන් ශිෂ්ඨ සමාජයට හුරු පුරුදු කරවීමය. එහෙත් කුඩා දරුවන් ඔවුන්ගේ දෙමාපියන්ගෙන් පවුලෙන්, ඔවුන්ගේ සුපුරුදු වටපිටාවෙන්, ඔවුන්ට ආවේනික සංස්කෘතියෙන් ඉවත්කිරීමෙන් දරුවන් තුළ ඇතිවෙන කම්පනය, මානසික පීඩාව ගැන රජයේ අවධානය යොමු වුනේ මෙම ප්‍රතිපත්තිය අරඹා දශක ගණනාවක් ගත වූ පසුවය. මෙම 'පැහැරගත් පරම්පරාව' නිසා ඕස්ට්‍රේලියාවේ ආදිවාසි ජනතාව ශතවර්ෂයකට ආසන්න කාලයක් නිහඬව දුක් වින්ද බව වටහාගෙන ඔවුන්ගෙන් සමාව අයැදීමට පියවර ගත්තේ පසුගිය නොවැම්බර් මාසයේදී මැතිවරණයෙන් ජය ලැබූ ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂයයි.

ඕස්ට්‍රේලියාවේ ආදිවාසින්ගේ ජිවිතයේ අඳුරු යුගයක් ලෙස හැඳින්විය හැකි මෙම කාලපරිච්ඡේදය තුළ ජිවත් වූ ඔවුන්ගේ දුක්ඛ දෝමනස්ස ඉතා තියුණු ලෙස සටහන් වී ඇත්තේ ඒ යුගයේදී ලියවුණ ඇබජින සන්නස නිර්මාණ අතරයා ඕනෑම රටක ජනතාවකගෙ " සිතුම් පැතුම්, ඔවුන් විඳි දුක් පීඩා මෙන්ම ඔවුන්ගේ අපේක්ෂා හා බලාපොරොත්තු කියාපෑමට සාහිත්‍ය නිර්මාණ තරම් ප්‍රබල මාධ්‍යක් නැත. සාහිත්‍යය යනු ජන ජිවිතයේ කැඩපත් යයි කියන්නේ මේ නිසාය.

ප්‍රකට කවියකු නාට්‍ය රචකයකු හා සමාජ සේවකයකු වන ජැක් ඩේවිස් (JACK DAVIS) ආදීවාසින්ගේ ජිවිතයේ දුක් දොම්නස් ඉතා තියුනු අන්දමින් නිරූපණය කළ සාහිත්‍යධරයෙකි.

ජැක් ඩේවිස් ලියූ 'කලු දිවිය' (BLACK LIFE) නමැති කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් කවියක සිංහල අනුවාදය මෙසේය.

'මගේ නම මට දෙන්න'
අනේ දෙවියනි
සුදු පාලකයින්
වළලා මගෙ අතීතය
සොරාගෙන මගේ නම
මගේ මව කලු නිසා
පැහැරගෙන ගොස්
බොරු නමක් මට දමා

මගේ නම මට දෙන්න
මා වැඩූ අම්මගේ
දෑත් උණුසුම දෙන්න
මා වටා දැවටුණු
ඇගේ උණුසුම දෙන්න
දෙන්න මට දෙවියනේ
මගේ මුල් නම
පමා වන්නට කලියෙන්

ජැක් ඩේවිස් (JACK DAVIS) මේ කවෙන් පවසන්නේ තම මවගෙන් කුඩා කලදීම ඉවත් කළ හැම කලු දරුවකු තුළම නිතැතින් ඇතිවන හැඟිමකි. මවගේ උණුසුම සමගම තමන්ගේ මුල් නම ඉපැමින් කුඩා දරුවකු අයැද සිටින්නේ ආදිවාසින්ට උරුම වූ ඔවුන්ගේ ජාතික සංස්කෘතික උරුමයන් නොවේද ?

සුදු ජාතිකයන් පළමුවරට ඕස්ට්‍රේලියාව සොයාගත් පසු ඔවුන් එය හැඳින්වූයේ "TERRA NULLIUS" හෙවත් කිසිවකුටත් අහිමි බිමක් ලෙසය. එහෙත් 1992 ඓතිහාසික මාබෝ තීන්දුව මගින් ඕස්ට්‍රේලියානු මාහාධිකරණ මගින් ආදිවාසින් සතු ඉඩම් අයිතිය පිළිගනු ලැබිය.

සුදු ඕස්ට්‍රේලියානුවන් විසින් ආදිවාසින් පරම්පරා ගණනාවක් තිස්සේ හිමිකම් කී ඉඩම් කොල්ලකමින් කළ කී දෑ නිරූපණය කරන සහිත්‍යංග රැසකි. බ්‍රිස්බෙන් නගරයේ උපත ලද ඇබරජින ජාතික කවියකු වන ජෝන් ග්‍රැහැම් (JOHN GRAMAM) 'ජීවමය බිම්කඩ' නමින් ලියූ කවියක කොටසක සිංහල අනුවාදය මෙසේය.

'ජිවමය බිම්කඩ'
බිම් කඩවල් පොරොන්දු වී
සොයාගන්ට බැරිවුණ සඳ
ආදිවාසි දන වැතිරුණු
බිම්කඩ උදුරා ගන්නට
සිතුවොත් මහ විපතකි
එය

ඒ පද්‍ය කොටස මා උපුටා ගත්තේ JOHN GRAMAM විසින් 1998 දී පළ කළ LAND WINDOW නමැති පද්‍ය සංග්‍රහයෙනි.

1992 දෙසැම්බරයේදී එවකට ඕස්ට්‍රේලියාවේ අගමැති පෝල් කීටින් (PAUL KEATING) කළ සුප්‍රසිද්ධ රෙඩ්ෆරන් දේශණය (REDFERN SPEECH) අපට කිසිවිටක අමතක නොවේ. ඕස්ට්‍රේලියාවේ ආදීවාසින්ගේ ජිවිතය අසරණභාවයට පත් කිරීම පිළිබඳ වගකීම පිළිගනිමින් මෙරට රාජ්‍ය නායකයකු ඉදිරිපත් කළ එම දේශනය දෙවෙනි වන්නේ මේ වසරේ පෙබරවාරි 13 දින කෙවින් රඩ් (KEVIN RUDD) අගමැතිවරයා ආදීවාසී පැහැරගත් පරම්පරාවෙන් සමාව අයැදීමේ දේශනයට පමණි. මෙරට ආදිවාසීන්ට මත්පැන් බොන්ට පුරුදු කළ ඔවුන්ගේ ඉඩම් පැහැරගෙන ඔවුන්ට ලෙඩ බෝකර, ඔවුන් මරා දමා ඔවුන් වනසා දැමීමට පියවර ගත්තේ ඕස්ට්‍රේලියානුවන් බව PAUL KEAJING එදින රෙඩ්පරන් (REDFERN) දේශනයේදී නොබියව ප්‍රකාශ කළේය. එවකට ඕස්ට්‍රේලියානු අගමැතිවරයාගේ මේ අදහස් පිළිබිඹු කරන කවි පන්තියක් "JACK DAVIS" කවියාගේ "BLAUK LIFE" කාව්‍ය සංග්‍රහයේ ඇත. එය සිංහලානුවාදය මෙසේය.

'මතකය'
කැලැත්තූ ගංගාවලට
වැනසු මහ වනයට
වස විස දැමූ ජලයට
සිර මැදුරු බත් පිඩට
දම්වැලට හා තුවක්කුවට
සමාව දෙනු ඇත ඔවුන්
හද ගැස්ම පමා කළ වරදට
හිරු මුහුණු මත හෙලූ
කුරිරු සෙවනැල්ලට
නොලැබෙනු ඇත නුඹට
සමාවක් ඔවුන්ගෙන්

'මතකය' නමැති ඒ කුඩා පැදි පෙළෙන් ධ්වනිත වන්නේ ඇබරිජින ජාතිකයන් තුළ පවත්නා දැඩි ආත්මාභිමානයයි. ස්වකීය පරම්පරා උරුමයන් වූ මහ පොළොව, ගංගා ඇළ දොළ වනාන්තර වලට සුදු ජාතිකයන් කළ විපතට වඩා ඔවුන් දැඩි කම්පනයට පත් වන්නේ තම ජාතියේ හදවත ඔවුන් කළ නිගාවයි. සුදු ජාතිකයන් කළ කවර වරදකට සමාව ලැබුනත් ආදිවාසී හදවතම, ආත්මයට සිදුකළ හානියට කිසිවිටක සමාවක් නොලැබෙන බව කියවෙන්නේ ඒ නිසාය. ස්වකිය ඇබර්ජින ජාතිකත්වය දිවිහිමියෙන් සුරකින බව පවසන පහත දැක්වෙන කවියද JAUK DAVIS ගේ නිර්මාණයකි.

'මම'
ආදි වැසියෙක්මි මම
නගරයේ විසුවත්
මගේ සිහින ලොව
රජයේ මහ රෝහලයි
අවලංගු කාසියකි මා
මගේ පෙකණි වැල
වෙද අඬුවෙන් බැඳි
ජිවානුහරණය කර
ඉංග්‍රිසි නමක් දී මට
දනිමි මම නිසැකවම
මගේ ශ්‍රෝත්‍රය,
මගේ හමේ පැහැය
දිවිහිමියෙන් මම
මුළු හදින්ම මම
ආදිවාසියෙක් මි.


ආචාර්ය පාලිත ගනේවත්ත

ඔබේ සොඳුරු මංගල දිනයේ



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- ෆර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම
ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**
*Salon Colour Box*
*14 Winterton Close*
*Epping*
***TP 9401 3727 / 0425 805 754***